ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ஊவா மாகாண கல்வித் திணைக்களம்

Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය - I | කාලය : පැය 01 යි. |
| --- | --- | --- |

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. නිර්දේශිත රාග අතුරෙන් තීව්‍ර මධ්‍යමය යෙදෙන රාගය හා එය අයත්වන මේලය තෝරන්න.
(1) භූපාලි රාගය - කළ්‍යාණ මේලය (2) යමන් රාගය - කළ්‍යාණ මේලය
(3) යමන් රාගය - බිලාවල් මේලය (4) බිලාවල් රාගය - කළ්‍යාණ මේලය

02. කාෆි රාගයට ආවේණික ස්වර සංගති ඇතුළත් වරණය තෝරන්න.
(1) සරිගරි ගපමග මරිස - (2) රිගරිම ගරිස, රිග මපධනි ධපමග
(3) ණිසගම, ධ - පම (4) සරිගප, ධප, ගපධප, ගරිස

03. විකෘති ස්වර හතරක් පමණක් යෙදෙන රාගය තෝරන්න.
(1) යමන් (2) කාෆි (3) භූපාලි (4) භෛරවි

04. "ම" ස්වරය කිසිසේත්ම යොදා නොගන්නා රාගයක් වන්නේ,
(1) යමන් (2) භූපාලි (3) කාෆි (4) බිලාවල්

05. ධෛවතය හා ගාන්ධාරය පිළිවෙළින් වාදි සහ සංවාදී ලෙස යෙදෙන නිර්දේශිත රාගය තෝරන්න.
(1) භූපාලි (2) යමන් (3) බිලාවල් (4) භෛරවී

06. යමන් රාගයට අදාළ නොවන කරුණ තෝරන්න.
(1) ගාන්ධාරය සහ නිෂාධය වාදි සංවාදි ස්වර වේ. (2) කළ්‍යාණ මේලයට අයත් වේ.
(3) ගායන සමය දිවා ප්‍රථම ප්‍රහරය වේ. (4) සම්පූර්ණ ජාති රාගයකි.

07. රාත්‍රි දෙවන ප්‍රහරයේ ගැයෙන රාගයකි.
(1) කාෆි රාගය (2) භූපාලි රාගය (3) යමන් රාගය (4) භෛරවි රාගය

08. බිලාවල් රාගයට අයත් තානාලංකාරයක් වන්නේ,
(1) නිරි ගරි ස - නිධ | පම´ ගම´ ගරි ස - (2) ගප ධනි ස̇නි ධප | ගම පග මරි ස -
(3) ණිස ගම පධ පම | ගම පම ගරි ස - (4) සරි ගප ධස̇ ධප | ගප ධප ගරි ස -

09. භූපාලි රාගයෙහි "මුඛ්‍යාංගය" තෝරන්න.
(1) ගරි, ගප, ධප, සරිග (2) ගපමග, මරිස, ගරිසධ, පග
(3) ගරිසධ̣, සරිග, පග, ධපගරිස (4) සරිග, පග, මපගම, ධපගරිස

10. රාගවල යෙදෙන ස්වර විශේෂ යටතෙහි "මධ්‍යමය" සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යමන් රාගයෙහි වර්ජ්‍ය ස්වරයක් ලෙස යෙදේ.
(2) කාෆි රාගයෙහි වාදි ස්වරය ලෙස යෙදේ.
(3) බිලාවල් රාගයෙහි සංවාදි ස්වරය ලෙස යෙදේ.
(4) භෛරවී රාගයෙහි වාදි ස්වරය ලෙස යෙදේ.

11. තිත් ක්‍රම දෙකක් ඇසුරු කර ගනිමින් ගායනා කෙරෙන වන්නම තෝරන්න.
(1) උකුසා වන්නම (2) සින්දු වන්නම
(3) තිසරා වන්නම (4) කෝකිල වන්නම

- අංක **12** සිට **15** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සටහන උපයෝගී කරගන්න. එහි දැක්වෙනුයේ නිර්දේශිත තාල 4 කින් උපුටාගත් තාල සංකේත සහිත විභාග හතරකි.

| A | B | C | D |
|---|---|---|---|
| ධ ධිං s | ධතුන | ධින | ධධිංධිංධ |
| X | O | X | 2 |

12. දීප්චන්දි තාලයට අයත් විභාගය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය නම් කරන්න.
(1) A (2) B (3) C (4) D

13. විභාග දෙකකින් සමන්විතව ඇති තාලය ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

14. තාලයට අදාළ සෑම විභාගයකම එක සමාන මාත්‍රා සංඛ්‍යාව බැගින් යෙදෙන නිර්දේශිත තාල ඇතුළත් වනුයේ,
(1) A හා B තුළය. (2) B හා C තුළය. (3) C හා D තුළය. (4) B හා D තුළය.

15. “D” අක්ෂරයට අදාළ තාලයේ මාත්‍රා බෙදීමට සමානව මාත්‍රා විභාග වන දේශීය තිත් රූපය වන්නේ,
(1) සුළු මැදුම් දෙතිත (2) මැදුම් මහ දෙතිත (3) මහ තනි තිත (4) මැදුම් තනි තිත

16. ගරිනිරි ගමප......... යන ස්වර අභ්‍යාසයේ මීළඟට යෙදෙන ස්වර ඛණ්ඩය තෝරන්න.
(1) මග සග මප ධ - (2) මරි ගරි ගමප - (3) ගම රිග පමග (4) මගරිග මපධ-

17. පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව වයලීනය සහ තබ්ලාව අයත් වන්නේ,
(1) තත් සහ සුෂිර වර්ගවලටය. (2) තත් සහ අවනද්ධ වර්ගවලටය.
(3) ඝන සහ අවනද්ධ වර්ගවලටය. (4) අවනද්ධ සහ සුෂිර වර්ගවලටය.

18. නිර්දේශිත රාගයකට අයත් නිවැරදි සර්ගම් පාදය තෝරන්න.
(1) නිධ-ප | ම́පගම́ | ප--- | පම́ගරි |
(2) නිධ-ප | පමගම | ප--- | පමගරි |
(3) නිධ-ප | ම́පගම́ | ප--- | පම́ගරි |
(4) නිධ-ප | මපගම | ප--- | පමගරි |

19. ජප් තාලයට බෙහෙවින්ම සමානතාවයක් දැක්වෙන දේශීය තිත් තාලය රූපය තෝරන්න.
(1) සුළු මහ දෙතිත (2) මැදුම් මහ දෙතිත (3) සුළු තනි තිත (4) සුළු මැදුම් දෙතිත

- අංක **20** සිට **23** තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත ස්වර ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.

| | | | |
|---|---|---|---|
| නි ස ග | ස ග ම ප | ග ම ප | නි - ධ - |
| O | 3 | X | 2 |
| සං නි ධ | නි ධ ප ම | ධ - ම | ග රි ස - |

20. ඉහත ස්වර ප්‍රස්ථාර කොටසින් පිළිබිඹු වන රාගය නම් කරන්න.
(1) කාෆි (2) භෛරවි (3) යමන් (4) භූපාලි

21. ඉහත ස්වර ප්‍රස්ථාරයට අදාල හින්දුස්ථානි තාලය වන්නේ,
(1) දීප්චන්දි (2) ත්‍රිතාලය (3) ජප්තාලය (4) කෙහෙර්වා

22. ඉහත රාගයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සර්ව කෝමල රාගයක් වශයෙන් ද හඳුන්වයි.
(2) පංචමය හා ෂඩ්ජය වාදි සංවාදි ස්වර ලෙස යෙදේ.
(3) සම්පූර්ණ ජාති රාගයක් වන මෙහි ම් යෙදේ.
(4) කාෆි ථාටයෙන් උපන් රාගයකි.

23. ඉහත ස්වර ප්‍රස්ථාරයට අදාළ ස්වර සංගතිය ඇතුළත් වරණය නම් කරන්න.
(1) නිසගම පධ පමගරිස (2) ගපධනි සංනි ධප ගරිස
(3) නිධම පගරි සරි ගමප- (4) නිරිගම́ ගරිස, පම́ ගරිස

24. නාට්‍යයේ නම හා ඊට අදාළ ගීතය නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.

(1) රතු හැට්ටකාරි - පළමුව මම වැන්ද බුදුන්

(2) තවු - සෝබාව දේ.

(3) තාරාවෝ ඉගිලෙති - මඬේ ලගින තාරාවන්

(4) අබුද්දස්ස කෝලම - අපි කිරිල්ලියෝ

25. අනාඝාතාත්මකව ගැයෙන මෙහෙ ගී පාදය නම් කරන්න.

(1) සඳවා සුදුවැලි පිවිතුරු

(2) බුද්ධං සරණේ සිරස දරාගෙන

(2) මලේ මලේ අර නාමල

(4) ඉපල් පිටින් ගහන අව්ව

• අංක **26** සිට **29** තෙක් ඇති ප්‍රශ්නවලට පහත සඳහන් රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



A



B



C



D

26. මංගල අවස්ථාවන්හිදී මඟුල් බෙර වාදනය සඳහා යොදා ගනු ලබන භාණ්ඩය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

27. පංචතූර්ය වාදනයේ දී විතතාතත ගණයට ගැනෙන භාණ්ඩය තෝරන්න.

(1) A (2) B (3) C (4) D

28. හේවිසි වාදනයේ දී ප්‍රධානත්වය උසුලන අවනද්ධ භාණ්ඩය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

29. කෝලම් රංග ශෛලිය සඳහා යොදා ගන්නා අවනද්ධ භාණ්ඩය ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) D

30. තාරතාවය, විපුලතාවය, ධ්වනිගුණය යන නාදයේ ත්‍රිවිධ ගුණයන් අතුරෙන් "ධ්වනිගුණය" හැඳින්වීම සඳහා භාවිතා කරන තවත් නාමයක් වන්නේ,

(1) ජාති භේදයයි.

(2) රූපභේදයයි.

(3) උච්චනීචභේදයයි

(4) නාද ප්‍රභේදයයි

31. පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරයට අදාළ ටයිම් සිග්නේචර්ය (Time Signature) තෝරන්න.



(1) $\frac{3}{3}$ (2) $\frac{2}{4}$ (3) $\frac{3}{4}$ (4) $\frac{4}{4}$

32. F major ස්කේලයට අයත් ස්වර පෙරදිග ක්‍රමයට පෙළ ගස්වා ඇති අයුරු තෝරන්න.

(1) ම ප ධ නි̲ ස̇ රි̇ ග̇ ම̇

(2) ම́ ප ධ̲ නි̲ ස̇ රි̇ ග̇ ම̇

(3) ම ප ධ̲ නි̲ ස̇ රි̇ ග̇ ම̇

(4) ම ප ධ̲ නි ස̇ රි̇ ග ම

33. වන්නමක් ආභාෂයෙන් නිර්මාණය වූ සරල ගීතයක් වන්නේ,

(1) ආදරයේ උල්පත වූ අම්මා
(2) රුක් අත්තන මල මුදුනේ
(3) මේ අවුරුදු කාලේ
(4) රෑ පැල් රකින කුරහන්

34. G Major Chord එකට අයත් ස්වර පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ම ධ ස
(2) ස ග ප
(3) රි ම ධ
(4) ප නි රි

- අංක 35 සිට 38 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා රංග සම්ප්‍රදායන්ට අදාළ පහත සඳහන් ගී පද කොටස් උපයෝගී කරගන්න.

A - වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ
B - රකිනු ඊශ්වරා
C - පායාලා අඹරේ

35. A, B, C යටතේ එන ගීත ඇතුළත් රංග සම්ප්‍රදායන් පිළිවෙළින් නම් කරන්න.

(1) සොකරි, කෝලම්, නාඩගම්
(2) කෝලම්, සොකරි, නාඩගම්
(3) සොකරි, නූර්ති, නාඩගම්
(4) නාඩගම්, නූර්ති, කෝලම්

36. "A" හි ඇතුළත් ගීතය ගායනයේ දී වාදනය කරනු ලබන අවනද්ධ භාණ්ඩය නම් කරන්න.

(1) ගැට බෙරය
(2) තබ්ලාව
(3) පහතරට බෙරය
(4) දවුල

37. "B" හි ඇතුළත් ගීතය ගායනයේ දී වාදනය කරනු ලබන භාණ්ඩය හා තාලය නම් කරන්න.

(1) මද්දලය - චාපු
(2) තබ්ලාව - දාදරා තාලය
(3) ගැටබෙරය - මැදුම් තනි තිත
(4) පහතරට බෙරය - මහ තනි තිත

38. "C" හි ඇතුළත් ගීතය වාදනය කරනු ලබන අවනද්ධ භාණ්ඩයකි.

(1) තබ්ලාව
(2) මද්දලය
(3) දවුල
(4) ගැටබෙරය

39. සත්සමුදුර සහ රේඛාව යන චිත්‍රපට දෙකේ සංගීතය නිර්මාණය කළ අධ්‍යක්ෂවරු දෙදෙනා පිළිවෙළින් නම් කර ඇති "වරණය" වන්නේ,

(1) සෝමදාස ඇල්විටිගල ශූරීන් සහ සරත් දසනායක ශූරීන්ය.
(2) ලෙස්ටර් ජේම්ස් පීරිස් ශූරීන් සහ සරත් දසනායක ශූරීන්ය.
(3) සෝමදාස ඇල්විටිගල ශූරීන් සහ බී.එස්.පෙරේරා ශූරීන්ය.
(4) ඩබ්ලිව්.ඩී.අමරදේව ශූරීන් සහ වික්ටර් රත්නායක ශූරීන්ය.

40. පහත දැක්වෙන්නේ මව්පිය ගුණ ඇතුළත් ගීත ලැයිස්තුවකි.

A. දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා.
B. අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී
C. අන්දර යායේ වැව් තාවල්ලේ
D. ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා

මෙම ගීත අතුරෙන් පිය ගුණ පිළිබඳ කියැවෙන ගීත ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B
(2) B සහ D
(3) A සහ D
(4) B සහ C

*****

උඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය - II | කාලය : පැය 02 යි. |
|---|---|---|

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

(1). අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) ස්වර සප්තකයට අයත් ශුද්ධ, කෝමළ, තීව්‍ර ස්වර ආරෝහණ ක්‍රමයට පිළිවෙළින් ලියා දක්වන්න.
(ii) ඔබ නිර්දේශයට අයත් සම්පූර්ණ ජාතියට අයත් නොවන රාගයක් නම් කරන්න.
(iii) ගපධනිසං, මගමරිස යන ස්වර සංගති අයත්වන රාගය නම් කරන්න.
(iv) දෙපානෝ ගීත නාටකයේ නිෂ්පාදකයා නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් හිස්තැන්වලට සුදුසු පිළිතුරු මෙහි වරහන් තුළ ඇති පාරිභාෂික පද අතුරෙන් තෝරාගෙන ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (සමුද්‍රඝෝෂ විරිත, දාදරා තාලය, ශ්‍රී ලංකා මා ප්‍රියාදර ජය භූමි, ශ්‍රී රාහුල හිමිගේ නාමේ)

(v) විදේශීය ශිල්පීන් ගැයූ චිත්‍රපට ගී .....................................
(vi) පැහැසරණිය මිණිපැමිණිය කොත් අගට ...........................................
(vii) ග්‍රැමෆෝන් ගී ..........................................
(viii) සාදු දන්ත දා ..........................................

- අංක 09 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ වැරදිය. එම ප්‍රකාශ නිවැරදි කර ලියන්න.

(ix) සත්සමුදුර චිත්‍රපටයේ සංගීත නිර්මාණය කළේ ආචාර්ය ඩබ්.ඩී.අමරදේව ශූරීන්ය.
(x) උච්ච ෂඩ්ජය (සං) ස්වරයට නියමිත කම්පන වාර සංඛ්‍යාතය 256 කි.

- හිස්තැන් පුරවන්න.

(xi) "එන්ඩද මැණිකේ මමත් දියඹටා" ගීතය ගයනු ලබන්නේ................................ විසිනි.
(xii) නාදයේ ත්‍රිවිධ ගුණ, විපුලතාවය, තාරතාවය, සහ .................................. ලෙස ද හඳුන්වනු ලැබේ.

(මුළු ලකුණු 12 යි)

(2). පහත A, B, C අක්ෂර යටතෙහි සඳහන් තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A. | අනුවාදි ස්වර | ස රි ම ප නි |
| B. | විකෘති ස්වර | රි ග ධ නි |
| C. | වර්ජිත ස්වර | ම නි |

(i) ඉහත තොරතුරුවලින් පිළිබිඹුවන රාග අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමඟ නම් කරන්න. (ලකුණු 03)
(ii) ඉහත තොරතුරුවලින් පිළිබිඹුවන රාග වලින් ඔබ කැමති රාගයක මධ්‍යාලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)
(iii) "B" අක්ෂරයට අදාළ රාගයෙහි ආරෝහණ ස්වර, මුඛ්‍යාංගය, වාදි ස්වරය ලියා දක්වන්න. (ලකුණු 03)

(3). පහත දැක්වෙන ස්වර සංගති ඇසුරින් පිළිතුරු සපයන්න.

(අ) ප ම ග ප, රි නි රි ස
(ආ) සස රිරි, ගග මම ප

(i) ඔබගේ පිළිතුරු පත්‍රයෙහි "අ" සහ "ආ" අක්ෂරවලට අයත් ස්වර සංගති නැවත ලියා ඉන් පිළිබිඹුවන රාග නම් කර, එම රාගවලට අදාළ ස්වර සංකේත ලකුණු කරන්න. (ලකුණු 04)

(ii) "අ" අක්ෂරය යටතේ සඳහන් ස්වර සංගතිය ස්වර අනුපිළිවෙළ වෙනස් නොකර ජප් තාලයට අනුව එක් ආවර්තයක් සම්පූර්ණ වන ලෙස ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) ත්‍රී තාලයෙහි ඨේකාව නියමිත මාත්‍රා අනුව තාල සංකේත සහිතව සමලයෙන් යුතුව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(4). (i) පහත වගුවේ "A" තීරුවේ සඳහන් ගී වර්ගයට අදාළව "B" හා "C" තීරුවේ සඳහන් තොරතුරු ක්‍රමවත්ව වගු ගත කර නොමැත. එම තොරතුරු ක්‍රමවත් ලෙස නැවත සකසා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

| **A තීරුව** | **B තීරුව** | **C තීරුව** |
|---|---|---|
| ගී වර්ගය | ගීතය | දායකත්වය / ගායනය |
| a. නූර්ති ගී | ඇත කඳුකර හිමව් අරණේ | නීතිඥ ජෝන් ද සිල්වා |
| b. කණ්ඩායම් ගී | සුදු සඳ එළියේ | ඩබ්.ඩී.අමරදේව |
| c. චිත්‍රපට ගී | රකිනු ඊශ්වරා | මී මැස්සෝ |
| d. මුද්‍රා නාට්‍ය ගී | මුළු ගතම වෙහෙසුණා | ඉන්ද්‍රානි විජේ බණ්ඩාර |

(ලකුණු 04)

(ii) නව නාට්‍ය දෙකක් නම් කර, එයට අදාළ ගීත දෙකක එක් පේළිය බැගින් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) නාඩගම් රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)


(5). (i) ජන ගී වර්ගීකරණයට අනුව වන්නම්, ප්‍රශස්ති, හටන් ගී අයත් වන්නේ කුමන ගී වර්ගයට දැයි සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ඉහත ගී වර්ග පිළිබඳ සුවිශේෂී කරුණු තුනක් අදාළ ගී සම්ප්‍රදාය සමඟ ලියන්න. (ලකුණු 03)

(iii) ආසාතාත්මක මෙහෙ ගීතයක් නම් කර, පාද දෙකක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 07)

(6). (i) පහත වරහන් තුළ දැක්වෙන සංගීත භාණ්ඩ පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව වර්ග කර දක්වන්න. (තබ්ලාව, සිතාරය, බටනලාව, වයලීනය, ජලතරංගය, එස්රාජය) (ලකුණු 03)

(ii) පහත රූප සටහනෙහි දැක්වෙන පරිදි තත් සුසර කර ගනු ලබන භාණ්ඩයේ නම ලියා, 2, 5, 6, 10 අංකවලට හිමි ස්වර නම් කරන්න. (ලකුණු 05)




(iii) තබ්ලාවක රූප සටහනක් ඇඳ එහි කොටස් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(7). (i). (a) Treble clef (ට්‍රෙබල් ක්ලෙෆ්) (d) Tie Notes (ටයි නෝට්ස්)
(b) Key Signature (කී සිග්නේචර්) (e) Bass clef (බේස් ක්ලෙෆ්)
(c) Time Signature (ටයිම් සිග්නේචර්)

යන අපරදිග ස්වර සංකේත දළ රූප සටහන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(ii) | + + ග ම | ප - ප ප | ධ - නි - | සං - - - | - - නි රිං |

ඉහත සඳහන් ස්වර ප්‍රස්තාර කොටස් අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 05)

(iii) පහත දැක්වෙන ස්වර පාදයේ 1, 2, 3, 4 යන අංක වලින් දැක්වෙන විභාග සඳහා යෙදිය යුතු මේජර් කෝඩ්ස් (Major Chords) ලියා දක්වන්න.

| 1: ස ග ප | 2: ධ - - | 3: ප නි ප | 4: සං - - |

(ලකුණු 02)

PARCEL NO

LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න